# කෝවිඩ් 19 සති පාසල සබරගමුව පළාත

## නිවිතිගල අධ්‍යාපන කලාපය

## 9 ශ්‍රේණිය-ඉතිහාසය-2021

### 7 වන සතිය

## ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය

ක්‍රියාකාරකම අංක 02- ඉන්දියාවේ බ්‍රිතාන්‍යයේ යටත්විජිතයක් වීම 1

පැවරුම් අංක 02

**හැඳින්වීම:-** ඉංග්‍රීසින් හා ප්‍රංශ ජාතිකයින් යුරෝපය තුල ආර්ථික හා දේශපාලනික බලය උදෙසා මේ වන විට බල අරගලයක නිරත වෙමින් සිටි අතර ඉංග්‍රීසින්ගේ පැමිණීමෙන් පසු ඉන්දියාවට ප්‍රංශ ජාතිකයින් පැමිණීමත් සමග එම ගැටුම් මේ දෙපාර්ශවය අතර ඉන්දියාව තුළ දී ඇති විය. මෙය ඉංග්‍රීසින්ට විශාල අභියෝගයක් විය.මෙහිදී ඉතා උපක්‍රමශීලී වූ ඉංග්‍රීසියෝින් සිය අභියෝගයන් ජය ගැනීමට පියවර ගත් අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්විය.

- **ගුණාත්මක යෙදවුම් :-** 9 ශ්‍රේණියේ ඉතිහාසය පෙළ පොත/ඉතිහාසය සටහන් පොත්/පෑන් පැන්සල්
- **ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්:-**
  - **පියවර 01 :-** ඉතිහාසය පෙළ පොතේ පිටු අංක 72 සිට 77 දක්වා හොඳින් කියවන්න.
  - **පියවර 02:-** @ පසුගිය සතියේ ප්‍රශ්ණාවලිය අවසන් වූ තැනින් ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කරගන්න.

    @ පසුව පහතින් සපයා ඇති ප්‍රශ්ණාවලිය සඳහා පිළිතුරු සපයන්න

    *[ එහිදී ප්‍රශ්නය සටහන් කර ගැනීමෙන් පසු පිළිතුරු ලිවීම අනිවාර්ය වේ]*



## ප්‍රශ්නාවලිය

1. **ක්‍රි. ව. 1701 එකේ දි මිය ගිය මුල්ම අධිරාජයා කවුරුන්ද ?**
2. **ක්‍රි.ව.1761 දී පොන්ඩිච්චේරිය බලකොටුවේ බලය තහවුරු කර ගත්තේ කුමන යුරෝපීය පිරිසක් විසින් ද?**
3. **බ්‍රිතාන්‍යයන් ඉන්දියාවේ බලය තහවුරු කිරීමට යොදගත් ක්‍රමවේද දෙකක් දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න.**
4. **සිපොයි කැරැල්ල යනු කුමක්ද?**
5. **සිපොයි කැරැල්ලට බලපෑ හේතු මොනවාද?**
6. **සිපොයි කැරැල්ලට බලපෑ ආසන්න හේතුව කුමක්ද ?**
7. **සිපොයි කැරැල්ල අසාර්ථක වීමට හේතු මොනවාද**
8. **සිපොයි කැරැල්ලේ ප්‍රතිඵල මොනවාද**
9. **සිපොයි කැරැල්ල අතරතුර ඉංග්‍රීසි වෙඩි පහරින් මිය ගිය සිපොයි භටයා කවුද?**
10. **සිපොයි කැරැල්ල ඇති වූ වර්ෂය ලියා දක්වන්න.**

**පසුවැඩ:-** ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ කැපී පෙනෙන අවස්ථාවක් ලෙස සිපොයි කැරැල්ල දැක්විය හැකි වේ.මෙය ඉන්දියානුවන් තුළ නිදහස පිළිබඳ හැඟීම් වර්ධනය වීමට බලපෑවේය."ඉන්දියානු නිදහස් සටනට මගකියූ 1857 සිපොයි කැරැල්ල" යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් ලියන්න

සැකසුම -- උදර අරවින්ද / නිවිතිගල අධ්‍යන කලාපය / කල්වාන ජාතික පාසල